**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**02 ශ්‍රේණිය - බුද්ධ ධර්මය -අගෝස්තු 01 සතිය**

**සැකසුම - බලංගොඩ අධ්‍යාපන කලාපය**

**එම්.එම්.ඉන්ද්‍රාවතී ( ර / විද්‍යාකර ප්‍රාථමික විද්‍යාලය)**

- පහත කවිය ශබ්ද නගා ගායනා කරන්න.

1.පාන්දරින් අවදි වෙලා
මුව කට පිරිසිදු කරලා
වත්තට ගොස් මල් නෙළලා
සුදු ඇඳුමින් සැරසීලා...

2 සඳ අහසේ බබළන්නේ
පුන් පොහොයයි මේ එන්නේ
හැමෝම සිල් අරගන්නේ
පන්සල වෙත පිය මැන්නේ....

3 හඳුන්කූරු පහන් තිරත්
පොල් තෙල් හා සුවඳ මලුත්
දානය හා දැහැත් විටත්
අරගෙන පන්සල් යන්නේ....

(1) කවිය ඇසුරෙන් පන්සලට යන විට රැගෙන යන දේවල් 4ක් පවසන්න.

(2) පන්සලට යන විට රැගෙන යන දේවල් 4ක් අඳින්න.



**1. වෙහෙර වහන්සේ**



**2. බෝධීන් වහන්සේ**



**3 .පිළිම වහන්සේ**

- <u>ඉහත රූප සටහන් ඇසුරෙන් හිස්තැන් පුරවන්න</u>.

(1) පන්සලට ගිය විට පළමුව වඳින්නේ ...........................................................

(2) පන්සලට ගිය විට දෙවනුව වඳින්නේ .....................................................

(3) පන්සලට ගිය විට තෙවනුව වඳින්නේ .....................................................